# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,964 - 2016 අප්‍රේල් මස 22 වැනි සිකුරාදා - 2016.04.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 794 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 796 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 803 | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මැයි මස 13 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අප්‍රේල් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## කටුනායක - සීදූව නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කටුනායක - සීදූව නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර "ලේකම්, කටුනායක- සීදූව නගර සභාව, සීදූව" යන ලිපිනයට 2016.05.20 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතු ය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| 03. *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| කාර්යාල සේවක සේවය 11 (පුස්තකාල සහායක) | 02 | රු. 24,250-10x250-10x270- 10x300-12x330 - රු.36,410 (12 වන පියවර ආරම්භක පියවර වේ) | අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයන් 06ක් සමත්විය යුතුවේ. |

වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද - පුස්තකාලයක සේවා කටයුතු පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

04. *වයස් සීමාව.-* ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත ස්ථිර සේවකයන් සඳහා මෙම වයස් සීමාව අදළ නොවේ.

05. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 3ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතු ය.
(v) මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

06. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/95 අනුව සිදුකරනු ලබන ව්‍යිමත් සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගැනේ.

07. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
(iii) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.
(iv) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයන් බැඳී සිටිය යුතු ය.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතු ය :

(i) උප්පැන්න සහතිකය,

(ii) පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,

(iii) අධ්‍යාපන සහතික.

කේ. ඒ. සී. පී. පුෂ්පකුමාර,
ලේකම්,
සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කටුනායක සීදූව නගර සභාව.

කටුනායක - සීදූව නගර සභාව

**....................... තනතුර සඳහා අයදුම් කිරීම**

01. *(අ)* මුලකුරු සමග නම :———————.

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———————.

03. *(අ)* ස්ථිර පදිංචි ලිපිනය :———————.

දුරකථන අංකය :———————.

*(ආ)* කාර්යාලයීය ලිපිනය :———————.

දුරකථන අංකය :———————.

04. (අ) උපන් දිනය :———————.

(ආ) 2016.05.20 දිනට වයස :———————.

අවුරුදු :———————, මාස :———————, දින :———————.

05. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:———————.

06. විවාහක/අවිවාහක බව :———————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :———————.

08. අධ්‍යාපන සුදුසුකම් :———————.

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :———————.

10. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද ? එසේ නම් විස්තර :———————.

ම විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, මෙ තනතුර සඳහා මා නුසුදුස්සෙකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව මම දනිමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

මෙම ආයතනයේ ................. තනතුර දරන ................... මයා/මිය/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම /හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු සකස් කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

———————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :———————.

04–965

# පළාත් පාලන නිවේදන

## හලාවත ප්‍රාදේශීය සභාව

### හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු මංමාවත් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හලාවත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. ජේ. ඒ. ශාන්ති මාලා හේමලතා,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

2016 මාර්තු මස 03 වැනි දින,
හලාවත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| *පාරේ නම* | *ආරම්භක ස්ථානය* | *අවසන් වන ස්ථානය* | *දිග කි. මී.* | *සාමාන්‍ය පළල (මීටර්)* | *මායිම්* පාරේ දකුණු පස | පාරේ වම් පස | *පිඹුරු අංකය* |
|---|---|---|---|---|---|---|---|
| සේනානායක ආරාම මාවත | පැරණි නගරය | සේනානායක ආරාමය | 0.30 | 0.9 | 01. ඩීන් ස්ටෝර්ස් | 01. ඩබ්. එස්. මෙන්ඩිස් | පී. එස්. 53 |
| | | | | | 02. එම්. තසීම් | 02. එන්. ජී. කේ. මෙන්ඩිස් | -එම- |
| | | | | | 03. ඩබ්. ජේ. ජේ. එම්. විජේගුණරත්න | 03. එච්. ග්රේටා පෙරේරා | -එම- |
| | | | | | 04. ඩබ්. පී. එම්. විජේගුණරත්න | 04. එච්. ටෙක්ලා පෙරේරා | -එම- |
| | | | | | 05. ඩබ්. ජේ. එම්. විජේගුණරත්න | 05. එච්. ලෙනාඩ් පෙරේරා | -එම- |
| | | | | | 06. ටී. එම්. එම්. ගුණසේකර | 06. එච්. බී. මලලසේකර | -එම- |
| | | | | | 07. ඊ. නිලානි සිල්වා | 07. ඩබ්. ටී. ඩී. එස්. ප්‍රනාන්දු | -එම- |
| | | | | | 08. ටී. ටී.එම්. ගුණසේකර | 08. සේනානායක ආරාමය | -එම- |
| | | | | | 09. එස්. ඒ. එල්. ඇන්ටන් සේනාරත්න | | -එම- |
| | | | | | 10. ජීවා ජූඩ් නිශාන්ත | | -එම- |
| | | | | | 11. ආර්. අජිත් මෙන්ඩිස් | | -එම- |
| | | | | | 12. ඩී. එම්. ෂෙල්ටන් දිසානායක | | -එම- |
| | | | | | 13. ඊ. ශ්රීනි සේනානායක | | -එම- |
| | | | | | 14. ඩී. එම්. ෂෙල්ටන් දිසානායක | | -එම- |
| | | | | | 15. ඒ. එස්. මාකස් පෙරේරා | | -එම- |
| ප්‍රඥතිලකතිස්ස මාවත | සේනානායක ආරාම මාවත | පෙරේරා මාවත | 0.60 | 8.0 | 01. ටී. එම්. එම. ගුණසේකර | 01. ඊ. නිලානි සිල්වා | පී. එස්. 54 |
| | | | | | 02. එස්. එම්. ඒ. ප්‍රේමලාල් | 02. හලාවත ප්‍රාදේශීය සභාව | -එම- |
| | | | | | 03. ඩී. එම්. චමින්ද සිල්වා | 03. හින්දු කෝවිල | -එම- |
| | | | | | 04. අල් මිස්බා විදුහල | 04. හින්දු කෝවිල | -එම- |
| | | | | | 05. ඩබ්. එස්. එම්. අබේසේකර | 05. සේනානායක ආරාමය | -එම- |
| | | | | | 06. ඩබ්. ජේ. ඊ. එම්. අබේසේකර | 06. එම්. රවිඳු සොයිසා | -එම- |
| | | | | | 07. ඩබ්. ආර්. ද සිල්වා | 07. ඒ. කාර්මිල් මරික්කාර් | -එම- |
| | | | | | 08. ඒ කාර්මිල් මරික්කාර් | 08. ක්ලෙමන්ට් | -එම- |
| | | | | | 09. බී. කෝදගොඩ | 09. සිත්ති සහීරා | -එම- |
| | | | | | 10. එම්. එස්. එම්. මවුලානා | 10. එච්. සමන් රවීන්ද්‍ර | -එම- |
| | | | | | 11. ක්ලෙමන්ට් | 11. ඩයලොග් සමාගම | -එම- |
| | | | | | 12. ග්‍රේෂන් පෙරේරා | 12. නවරත්න හිමිකරුවෝ | -එම- |
| | | | | | 13. එච්. අසෝක පෙරේරා | 13. තිලක් පතිරණ | -එම- |
| | | | | | 14. ටී. ඒ. ද සිල්වා | 14. ටෙනිසන් පෙරේරා | -එම- |
| | | | | | | 15. නිලන්ති සහ තවත් අය | -එම- |
| | | | | | | 16. නිලන්ති | -එම- |
| | | | | | | 17. පී. පී. පුෂ්පකුමාර | -එම- |

| පාරේ නම | ආරම්භක ස්ථානය | අවසන් වන ස්ථානය | දිග කි. මී. | සාමාන්‍ය පළල (මීටර්) | මායිම් පාරේ දකුණු පස | පාරේ වම් පස | පිඹුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| හිජ්රා මාවත | පැරණි නගරය | මාදම්පේ රෝහල | 0.60 | 6.0 | 01. එම්. කේ. ටී. ෆජරියා | 01. අයි. එන්. නිසාර් | පී. එස්. 51 |
| | | | | | 02. මොහොමඩ් රිසාන් | 02. අයි. සිෆායා | -එම- |
| | | | | | 03. එම්. සී. එම්. රිම්සාන් | 03. එම්. එච්. මරික්කාර් | -එම- |
| | | | | | 04. එස්. ලෆීර් | 04. ඒ. සුබියාන් | -එම- |
| | | | | | 05. හම්සුල් ෂකීලා | 05. එස්. එම්. අසාද් | -එම- |
| | | | | | 06. රහිලා උම්මා | 06. එම්.එස්.එම්. අසනූන් | -එම- |
| | | | | | 07. මිල්ටන් පෙරේරා | 07. ඒ. සී. එම්. රෆීක් | -එම- |
| | | | | | 08. විමලාවතී | 08. මොහොමඩ් නසීම් | -එම- |
| | | | | | 09. ප්‍රියදර්ශන | 09. පාතිමා රිසානා | -එම- |
| | | | | | | 10. එම්. හුසෙයියාර් | -එම- |
| | | | | | | 11. එම්. එල්. සිට්ටි වසීලා | -එම- |
| | | | | | | 12. එම්. අයි. ඊබ්‍රාහිම් | -එම- |
| | | | | | | 13. ඒ. එම්. හවුෆ් | -එම- |
| | | | | | | 14. ඒ. කේ. අස්වර් | -එම- |
| | | | | | | 15. එන්. එම්. සමීර් | -එම- |
| | | | | | | 16. නවස්දීන් | -එම- |
| | | | | | | 17. එම්. ඒ. එම්. මොහොමඩ් | -එම- |
| | | | | | | 18. එස්. ඒ. ඩේවිඩ් | -එම- |
| | | | | | | 19. චන්දන | -එම- |
| දර්ගා මාවත | පැරණි නගරය | සන්ද්‍රික් සිල්වා මාවත | 0.25 | 6.0 | 01. පල්ලිය වත්ත | 01. පී. එම්. කිස්මත් | පී. එස්. 52 |
| | | | | | 02. එස්. එම්. එස්. මරික්කාර් | 02. පී. එම්. කිස්මත් | -එම- |
| | | | | | 03. ඒ. සාරා උම්මා | 03. එම්. එෆ්. එම්. අරෆත් | -එම- |
| | | | | | 04. ජේ. එම්. ඉෆාම් | 04. එස්. අයි. බදුර්දීන් | -එම- |
| | | | | | 05. එම්. කරීස් | 05. ජේ. එම්. ජෆීනා | -එම- |
| | | | | | 06. පී. එම්. හරීස් | 06. එම්. එස්. එම්. රජාබ්දීන් | -එම- |
| | | | | | 07. සම්සුල් හනීඩා | 07. එස්. එච්. එම්. ජිෆ්රි | -එම- |
| | | | | | 08. ෆාරුක් සහ සුල්තාන් මරික්කාර් | 08. ආර්. එම්. නස්රින් | -එම- |
| | | | | | 09. එච්. එම්. රහුමත් කානි | 09. එස්. එම්. උවයිස් | -එම- |
| | | | | | 10. එස්. එච්. එම්. හුසේන් | 10. එස්. එන්. එම්. බෙගම් | -එම- |
| | | | | | 11. එම්. එස්. එම්. අස්කාර් | 11. සල්හා නච්චියා | -එම- |
| | | | | | 12. මොහොමඩ් සියාම් | 12. කේ. සම්සුල් හනීඩා | -එම- |
| | | | | | 13. මොහොමඩ් කාසිම් | 13. සුල්තාන් මරික්කාර් | -එම- |
| | | | | | 14. එම්.එම්. රුස්ති | 14. නමීර් | -එම- |
| | | | | | 15. ජේ. එම්. කරුණාරත්න | 15. එස්. එම්. නසාර් | -එම- |
| | | | | | | 16. එම්. එස්. එම්. රිස්මි | -එම- |
| | | | | | | 17. මොහොමඩ් සදන් | -එම- |
| | | | | | | 18. ඒ. එම්. තහීර් | -එම- |
| | | | | | | 19. මොහොමඩ් නස්ලීම් | -එම- |
| | | | | | | 20. අස්ලම් | -එම- |
| සන්ද්‍රික් සිල්වා මාවත | තනිවැල්ල පාර | අඹ සෙවණ | 0.70 | 7.5 | 01. එම්. ලලිත් ද සිල්වා | 01. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | පී.එස්. 50 |
| | | | | | 02. -එම- | 02. පී. වී. ආර්. පීරිස් | -එම- |
| | | | | | 03. ටී. සෝමරත්න ද සිල්වා | 03. එන්. ධනුජ මෙන්ඩිස් | -එම- |
| | | | | | 04. ඩී. එම්. චමින්ද සිල්වා | 04. එම්. ධනුෂ සොයිසා | -එම- |
| | | | | | 05. -එම- | 05. එම්. රවිඳු සොයිසා | -එම- |
| | | | | | 06. එස්. ඒ. ආර්. චන්ද්‍රසිරි සහ එච්. එල්. මෛත්‍රීපාල | 06. ඩබ්ලිව්. ආර්. ද සිල්වා | -එම- |
| | | | | | 07. සේනානායක ආරාමය | 07. එල්. එම්. නවුෆර් | -එම- |
| | | | | | 08. ඩබ්. ජේ. ඊ. එම්. අබේසේකර | 08. ජේ. සෙයිනූල් ආබ්දීන් | -එම- |
| | | | | | 09. අබ්දුල් කාදර් | 09. අබ්දුල් සුකූර් | -එම- |
| | | | | | 10. ටී. අමීර්ඩීන් | 10. ඉස්ලාහියා අරාබි විද්‍යාලය | -එම- |
| | | | | | 11. ඒ. ඩබ්ලිව්. එම්. කාසිම් | 11. සෙයියදු බදුර්දීන් | -එම- |
| | | | | | 12. එම්. බී. එම්. ඉක්බාල් | 12. එම්. ලාෆීර් | -එම- |
| | | | | | 13. එම්. එච්. එම්. රිස්වාන් | 13. ජේ. ඉෂාක්කු | -එම- |

| පාරේ නම | ආරම්භක ස්ථානය | අවසන් වන ස්ථානය | දිග කි. මී. | සාමාන්‍ය පළල (මීටර්) | මායිම් පාරේ දකුණු පස | මායිම් පාරේ වම් පස | පිඹුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 14. එම්. පතාවුල්ලා | 14. අයිනූන් නහීරා | -එම- |
| | | | | | 15. කාර්මෙල් | 15. එස්. එම්. ස්වයිස්දීන් | -එම- |
| | | | | | 16. නව්ෂාඩ් | 16. නසාර් සහ එස්. එම්. නස්ලීන් | -එම- |
| | | | | | 17. අප්වර්ට් | 17. සෆ්රාස් | -එම- |
| | | | | | 18. ජේ. එම්. කරුණාරත්න | 18. එන්. එම්. රුෆීල් | -එම- |
| | | | | | 19. එම්. එම්. අෂ්රත් | 19. පාතිමා සියාරා | -එම- |
| | | | | | 20. එස්. එම්. මවුසූනා | 20. අජන්ත සිල්වා | -එම- |
| | | | | | 21. එමලින් ගුණසිංහ | 21. ඒ. නේපාලි පෙරේරා | -එම- |
| | | | | | 22. අසංක සිල්වා | 22. දෙදින් | -එම- |
| | | | | | 23. අජන්ත සිල්වා | | |

04-887

---

## කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥා පනතේ 71(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "පාවුලු පෙරේරා මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

කඩුවෙල මහා නගර සභාවේ දී ය.

*උපලේඛනය*

| | | | |
|---|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | :- | කඩුවෙල මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | :- | කොළඹ |
| 03. | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | :- | 477/සී, පොතුඅරාව |
| 04. | වීථියේ වර්තමාන නම | :- | නැත |
| 05. | අලුතින් යොදා ඇති නම | :- | පාවුලු පෙරේරා මාවත |
| 06. | මාර්ග විස්තර | :- | |

(i) *මාර්ගයේ ආරම්භය :*

| | | |
|---|---|---|
| වම්පස | :- | මාලබේ පොතුඅරාව ශ්‍රී සුබෝධාරාම පාරේ වරිපනම් අංක 21/47ඒ දරන දේපල |
| දකුණු පස | :- | මාලබේ පොතුඅරාව ශ්‍රී සුබෝධාරාම පාරේ වරිපනම් අංක 21/48 දරන දේපල |

(ii) *මාර්ගයේ අවසානය :*

| | | |
|---|---|---|
| වම්පස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ 21/43 දරන දේපල |
| දකුණු පස | :- | නම් කිරීමට යෝජිත මාර්ගයේ 21/43ඒ දරන දේපල |

04-774/1

---

## කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 71(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "සමනල උයන" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

කඩුවෙල මහා නගර සභාවේ දී ය.

උපලේඛනය

01. පළාත් පාලන ආයතනයේ නම :- කඩුවෙල මහා නගර සභාව
02. දිස්ත්‍රික්කය :- කොළඹ
03. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- 488- කොරතොට
04. වීථියේ වර්තමාන නම :- නැත
05. අලුතින් යොදා ඇති නම :- සමනල උයන
06. මාර්ග විස්තර :-

(i) *මාර්ගයේ ආරම්භය :*

වම්පස :- කොරතොට මැණිකාගාර පාරේ වරිපනම් අංක 80 දරන දේපල
දකුණු පස :- කොරතොට මැණිකාගාර පාරේ ඉදිවෙමින් පවතින නව නිවසකින්

(ii) *මාර්ගයේ අවසානය :*

වම්පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 76/48 දරන දේපල
දකුණු පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 76/65 දරන දේපල

04-774/2

---

## කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥපනතේ 71(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "වේරගල මාවත" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

කඩුවෙල මහා නගර සභාවේ දී ය.

උපලේඛනය

01. පළාත් පාලන ආයතනයේ නම :- කඩුවෙල මහා නගර සභාව
02. දිස්ත්‍රික්කය :- කොළඹ
03. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- 494/ඒ, නැගෙනහිර හෝකන්දර
04. වීථියේ වර්තමාන නම :- නැත
05. අලුතින් යොදා ඇති නම :- වේරගල මාවත
06. මාර්ග විස්තර :-

(i) *මාර්ගයේ ආරම්භය :*

වම්පස :- හොරහේන ප්‍රධාන මාර්ගයේ වම්පස හිස් ඉඩමකින්
දකුණු පස :- හොරහේන ප්‍රධාන මාර්ගයේ වම්පස වරිපනම් අංක 203 දරන දේපල

(ii) *මාර්ගයේ අවසානය :*

වම්පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ වම් පස හිස් ඉඩමකින්
දකුණු පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ වරිපනම් අංක 197/5 දරන දේපල

04-774/3

## කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥා පනතේ 71(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "ෆීල්ඩ් එජ් ගාඩ්න්ස්" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

කඩුවෙල මහා නගර සභාවේ දී ය.

උපලේඛනය

01. පළාත් පාලන ආයතනයේ නම :- කඩුවෙල මහා නගර සභාව
02. දිස්ත්‍රික්කය :- කොළඹ
03. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- 488, කොරතොට
04. වීථියේ වර්තමාන නම :- නැත
05. අලුතින් යොද ඇති නම :- ෆීල්ඩ් එජ් ගාඩ්න්ස්
06. මාර්ග විස්තර :-

(i) *මාර්ගයේ ආරම්භය :*

වම්පස :- වදුරන්මුල්ල ශ්‍රී සුමනතිස්ස මාවතේ වම්පස වරිපනම් අංක 33 දරන දේපල
දකුණු පස :- වදුරන්මුල්ල ශ්‍රී සුමනතිස්ස මාවතේ වම්පස වරිපනම් අංක 37 දරන දේපල

(ii) *මාර්ගයේ අවසානය :*

වම්පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ වම්පස වරිපනම් අංක 33/2 දරන දේපල
දකුණු පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ දකුණුපස වරිපනම් අංක 33/7 දරන දේපල

04-774/4

---

## කඩුවෙල මහා නගර සභාව

1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරිය වූ මහා නගර සභා ආඥා පනතේ 71(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති පාර "රජමල්වත්ත 6 වන පටුමග" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලේඛා ගීතාංජලී,
නාගරික කොමසාරිස්,
කඩුවෙල මහා නගර සභාව.

කඩුවෙල මහා නගර සභාවේ දී ය.

උපලේඛනය

01. පළාත් පාලන ආයතනයේ නම :- කඩුවෙල මහා නගර සභාව
02. දිස්ත්‍රික්කය :- කොළඹ
03. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- 492/ඩී, රජමල්වත්ත
04. වීථියේ වර්තමාන නම :- නැත
05. අලුතින් යොද ඇති නම :- රජමල්වත්ත 6 වන පටුමග
06. මාර්ග විස්තර :-

(i) *මාර්ගයේ ආරම්භය :*

වම්පස :- බත්තරමුල්ල රජමල්වත්ත පාරේ වරිපනම් අංක 89 දරන දේපල
දකුණු පස :- බත්තරමුල්ල රජමල්වත්ත පාරේ වරිපනම් අංක 89/56 දරන දේපල

(ii) *මාර්ගයේ අවසානය :*

වම්පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ වම්පස වරිපනම් අංක 89/35 හා අශෝක මාවතේ වරිපනම් අංක 18 දරන දේපල
දකුණු පස :- නම් කිරීමට යෝජිත මාර්ගයේ දකුණුපස වරිපනම් අංක 89/47 හා අශෝක මාවතේ වරිපනම් අංක 24 දරන දේපල

04-774/5

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා)

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ 03 උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ලංසකාර මුදියන්සේලාගේ චන්ද්‍රිකා සමන්ති නිර්මලා කුමාරි ගලබඩගම වන මම ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ආදහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අයකිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 2016.01.06 දිනැති අංක 107 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය,<br>ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>ප්‍රාදේශීය සභාව,<br>ආණමඩුව.

2016 ජනවාරි මස 06 වැනි දින,<br>ආණමඩුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණ අංකය - 107

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ 1 වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ දෙවැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.08.31 වැනි දින අංක 1930/6 දරන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පලකරන ලද -

* ප්‍රදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
* වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* ආදහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම, හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අයකිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව.

ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක විය යුතු වන 1987 අංක 15 දරන සභා පනතේ 09(03) වැනි උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

04-796/1

---

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා)

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ 03 උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ලංසකාර මුදියන්සේලාගේ චන්ද්‍රිකා සමන්ති නිර්මලා කුමාරි ගලබඩගම වන මම ප්‍රාදේශීය සභාවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 2016.02.17 වන දිනැති තීරණ අංක 118 යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය,<br>ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>ප්‍රාදේශීය සභාව,<br>ආණමඩුව.

2016 පෙබරවාරි මස 17 වැනි දින,<br>ආණමඩුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණ අංකය - 118

තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ 1 වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ දෙවැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015.09.25 වැනි දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අතිවිශේෂ) ගැසට් පත්‍රයේ* පලකරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක විය යුතු වන 1987 අංක 15 දරන සභා පනතේ 09(03) වැනි උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

04-796/2

---

සංශෝධනය

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව - දෙහිඕවිට**

ගෝ ඝාතක ආඥාපනත (272) වැනි අධිකාරිය

2016.03.18 දින අංක 1959 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළාත් පාලන නිවේදන 03-525 යටතේ පළ වූ ඡේදයේ "එම්. ආර්. ෆාතිමා යස්මින් නැමති අය, අවිස්සාවේල්ල, නාපාවල එම්. එම්. එම්. නියාස් නැමති අයට අයත්" යනුවෙන් ඇතුළත් කර සංශෝධනය කරන ලදී.

ආර්. එම්. ඩී. රත්නායක,
ලේකම් (වැ.බ.),
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු 30 වැනි දින,

04-906

---

**නාරම්මල ප්‍රාදේශීය සභාව**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නාරම්මල ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර වන මම ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 2016.01.20 දිනැති තීරණ අංක 538 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1982 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.09.25 වැනි දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අතිවිශේෂ) *ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ පළකරනු ලැබුවාවූ ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, 1952 අංක 06 දරන පළාත් පාලන අතුරු ව්‍යවස්ථාවේ 3 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 122 හා 126 වන වගන්ති ප්‍රකාරව මම තීරණය කරමි.

04-907

# අතුරු ව්‍යවස්ථා

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනත)

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් එදිරිසිංහ ආරච්චිල්ලාගේ සෝමරත්න වන මම,

ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.02.12 දිනැති තීරණ අංක 1270 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඊ. ඒ. සෝමරත්න,<br>
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය<br>
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,<br>
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

*තීරණය*

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.09.25 වැනි දින අංක 1933/40 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ පළ කරනු ලැබුවා වූ,

ප්‍රාදේශීය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

*නිකවැරටිය ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස සඳහන් කරනු ලැබේ.

02. නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත්වල ජනනය වන ඝණ අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

03. නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවකුම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍යසම්පන්න හා ප්‍රසන්න තත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කළ යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝණ අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුද හැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල වන කාර්යයන් සඳහා මනා තත්වයෙන් පවත්වා ගත යුතු වේ.

(iv) නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 5(I) උපවගන්තියට අනුකූලව එක්රැස්වන කසල භාර ගැනීම සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් පූර්ව දැනුම් දීමකින් අනතුරුව නිශ්චිත සේවාවක් පවත්වාගෙන යා යුතු අතර එකී (1) වන උපවගන්තියේම සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ සභා බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමයට හා කාලසටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් භාර දිය යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වයට හානිකර හෝ අන්තරාකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම නොකළ යුත්තේ ය.

06. (i) කිසිම තැනැත්තෙක් වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට, රක්ෂිතයකට හෝ ජලාශයකට, කළපුවකට, ජල මූලාශ්‍රයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකරවන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබා ගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන වගන්තියේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත 6 (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

07. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළත ම බැහැර කළ හැකිය.

(අ) නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කරන ලද ප්‍රදේශයක් වීම.

(ආ) නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයේ හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියකට අනුකූලව ඉදිකරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු ''කොම්පෝස්ට් බඳුන්'' සඳහා ලේකම්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේනම් ලේකම්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින් හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සැපයිය හැකිය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන 'ගෙවතු අපද්‍රව්‍ය' හැකිතාක් අදාළ පරිශ්‍රය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතු ය. අනතුරුව ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවීමක් මත නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසළ එක්රැස් කරනු ලබන අයට භාර දිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේ ය. එසේ මළපහ කරනු ලැබුවහොත් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට, ඇලකට, දෙළකට, ජල මූලාශ්‍රයකට, රක්ෂිතයකට හෝ කළපුවකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට සැලැස්මක් අනුමත කරවා ගැනීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ පරිශ්‍රයේ ජනනය වන ඝණ අපද්‍රව්‍ය හා මුද හරිනු ලබන ද්‍රව්‍ය පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ සැළසුම ඔහුගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

*නිවාස පරිශ්‍රයන්*

08. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය.

(*අ*) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(*ආ*) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(*ඇ*) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(*ඈ*) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
(*ඉ*) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේ ය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසුව පමණක් නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අදාළ අපද්‍රව්‍ය භාර ගැනීම සිදු කළ යුතු ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම 8 (i) උපවගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. නොඑසේ නම් නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් එම අපද්‍රව්‍ය එක්රැස් කරන බහාලුමකට බැහැරලීම කළ හැක්කේ ය.

09. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන්කළ යුත්තේ ය :-

(*අ*) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(*ආ*) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(*ඇ*) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(*ඈ*) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
(*ඉ*) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 9 (I) වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ඉහත *(අ), (ආ)* සහ *(ඇ)* යන අයිතමය යටතේ විස්තර කර ඇති අපද්‍රව්‍ය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමිතීන්ට පිරිවිතරයන්ට අනුකූල වූ බහාලුම් සපයාගත යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වාගත යුතු ය.

(iii) 9 (i) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී ලේකම්වරයා විසින් දැනුම්දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේය. ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියා කිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 9(i) වන උපවගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ කාර්යය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සකස්කර පවත්වාගෙන යනු ලබන ස්ථානයකට බැහැර කිරීම හෝ එසේ නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකුට භාරදීම කළ යුත්තේ ය.

(vi) ඉහත 9 (i) (ඇ) අයිතමයෙහි සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත *(අ), (ආ), (ඈ)* සහ *(ඉ)* යන අයිතමයන් යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු, කුලී නිවැසියා හෝ පදිංචිකරු එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

10. (i) නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ 10 (ii) වන උපවගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසරදීම ලේකම්වරයාගේ කාර්යය විය යුත්තේ ය.

*සාප්පු සහ කාර්යාල*

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ කළමණාකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,

(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ කළමණාකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.
(iv) මහල් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ කළමණාකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (iv) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුට සහ කළමණාකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උපවගන්තියේ *(ඇ)* අයිතමයේ සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසු නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ කසල එක්රැස් කරන්නෙකු වෙත භාරදීම නීත්‍යානුකූල වන්නේ ය.

(vii) ඉහත (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත *(අ), (ආ), (ඈ)* යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍රවීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුම හෝ කළමණාකරුවෙකුම එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

(viii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම හෝ කළමණාකරුවෙක්ගේම වගකීම වන්නේ ය.

*හෝටල්*

12. (i) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,

(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොද නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 (i) වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 (iv) වන උපවගන්තිය යටතේ බාර ගනු නොලැබූ ඉහත *(අ), (ආ)* අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව සකස් කරන ලද බහාලුමකට හෝ නම් කරන ලද ස්ථානයට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(vi) ඉහත *(ඇ)* ඡේදයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත *(අ), (ආ), (ඇ)* යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සෑම හෝටල් හිමිකරුවෙකුම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

*එළවළු සහ පළතුරු වෙළඳසැල්*

13. (i) සෑම එළවළු සහ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම වෙළඳසැලේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් දිරන අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (i) වැනි උපවගන්තියේ *(අ)* අයිතමයෙහි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(i) වැනි උපවගන්තියේ *(අ), (ආ)* අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (iii) වැනි උපවගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත *(අ), (ආ)* ඡේද යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යය සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*මස්, මාළු, හෝ බිත්තර වෙළඳ කුටි*

14. (i) තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ඊට අදාළ යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේ දී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හැරුණුවිට වෙනත් කිසිම සතෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ වෙනත් දිරන අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වැනි උපවගන්තියේ *(අ)* අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුළත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වැනි වගන්තියේ *(අ), (ආ)* අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසර ලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය. එසේ භාරදෙනු නොලැබූ ඉහත *(අ), (ආ)* අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යයක් නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන කසල එක්රැස් කරන තැනැත්තෙකුට භාරදීම හෝ ස්ථානයකට බැහැර කිරීම කළ යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (iv) වැනි උපවගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම*

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සංචාරක හෝ පදික වෙළෙන්දෙක්, ඊට අදාළව යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හා ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ ජල කානුවකට හෝ පොදු ස්ථානයකට නොදැමිය යුත්තේ ය.

(ii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම වාහනවල ගමනාගමනයට හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(*අ*) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(*ආ*) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(*ඇ*) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උප වගන්තියේ (*අ*) අයිතමයේ සඳහන් කර ඇත්තා වූ අපද්‍රව්‍ය කෘමීන්, මීයන් හෝ වෙනත් සතුන් විසින් කා දැමීමට නොහැකි වන පරිදි ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම හෝ සංචාරක වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උප වගන්තියේ (*අ*) හා (*ආ*) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍යය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය.

(vi) ඉහත (iii) (*ඇ*) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (*අ*), (*ආ*) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර පදික වෙළෙන්දා හෝ සංචාරක වෙළෙන්දා එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (v) වන උප වගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත (*අ*), (*ආ*) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව තබන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. සෑම සංචාරක/පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීමට පෙර නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

*කර්මාන්ත ශාලා*

16. (i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කළ යුත්තේ ය.

(*අ*) ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(*ආ*) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(*ඇ*) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(*ඈ*) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 16 (1) යන උප වගන්තියේ (*අ*), (*ආ*) හා (*ඈ*) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම මත නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුතු ය.

(iii) වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) ඉහත 16 (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (*අ*), (*ආ*) (*ඈ*) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර කර්මාන්ත ශාලා හිමිකරු හෝ ඔහු විසින් බලය දී ඇති තැනැත්තා එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

*කැනීම්, ඉදිකිරීම් සහ කඩා දැමීම*

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 17 (i) වන උප වගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

*ආරෝග්‍යශාලා*

18. (i) ආරෝග්‍යශාලාවක භාරකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) සායනික අපද්‍රව්‍ය,
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 18 (i) වන උප වගන්ති යටතේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩපිළිවෙලක් යටතේ කසළ එක්රැස් කරනු ලබන අවස්ථාවක නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතුය. 18 (i) උපවගන්තියේ *(ඉ)* අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාර දිය යුතු ය.

(iii) 18 (i) *(ඇ), (ඈ)* අයිතම යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර, එකී අපද්‍රව්‍ය වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

*පෞද්ගලික රෝහල් හා රසායනාගාර*

19. (i) පෞද්ගලික රෝහලක හෝ රසායනාගාරයක හිමිකරු හෝ අයිතිකරු තම ආයතනය තුළ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය ;

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) සායනික අපද්‍රව්‍ය,
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 19 (i) වන උපවගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩ පිළිවෙළක් යටතේ කසල එක්රැස් කරන අවස්ථාවක නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසළ එක්රැස් කරන්නා වෙත භාරදිය යුතු ය.

(iii) 19 (i) උපවගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාරදිය යුතු ය.,

(iv) ඉහත 19 (i) උප වගන්තියේ (ඇ), (ඈ) අයිතමය යටතේ එකතු වන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර, එකී අපද්‍රව්‍ය 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්ති යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

*වෙනත් පරිශ්‍රයන්*

20. (i) අංක 8 සිට 19 දක්වා වන ඡේදයන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සාමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 20 (i) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන පුද්ගලයෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා නිකවැරටිය ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 20 (i) වන උපවගන්තියේ (අ), (ආ) හා (ඇ) අයිතම යටතේ එක්රැස් වන අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබූ පරිදි ප්‍රකාශයට පත් කර ඇති ගාස්තුවක් අය කර නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකු විසින් භාර ගැනීම නිත්‍යානුකූල වන්නේ ය.

(v) එසේ වුවද, කිසියම් වූ ආගමික ස්ථානයක ආගමික කාර්යයක් වශයෙන් වානිජ පරමාර්ථයකින් තොරව පවත්වාගෙන යන කවර ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් වුව ද එකී ක්‍රියාකාරකම හේතුවෙන් එක්රැස් වන ඉහත (i) උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන අයිතම යටතේ එක්රැස්වන අපද්‍රව්‍ය බැහැර කරලීම සම්බන්ධයෙන් ඉහත (iv) උපවගන්තියේ සඳහන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම යන්න අදාළ නොවේ.

(vi) ඉහත (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ). (ආ) සහ (ඇ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර, අදාළ පරිශ්‍රවල හිමිකරුවන් එම කසළ බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

*වීථි සහ පොදු ස්ථාන*

21. (i) නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ආකාරයට සභාපතිවරයා විසින් පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

(අ) නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම,

(ආ) නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ තාවකාලිකව එක්රැස් කිරීමට යථායෝග්‍යයැයි හඳුනාගන්නා ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සවිකිරීම හා නඩත්තු කිරීම,

(ඇ) උත්සවවල දී, විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී නිකවැරටිය ප්‍රාදේශීය සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම,

(ඈ) කසළ තාවකාලික එක්රැස් කිරීමට යථායෝග්‍ය යැයි හඳුනාගෙන ඇති ස්ථානවල සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම,

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශන කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම,

(ii) නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන්ම එක් එක් අපද්‍රව්‍ය සඳහා වෙන් කරනු ලැබූ බක්කියක ඊට අදළ නොවන අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

*නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ යුතුකම්*

22. (i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡාකර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම,

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම,

(ඇ) ප්‍රතිභාවිතකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම,

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම් පිරිනැමීම,

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ ආකෘති නියාමනය කිරීම,

(ඊ) නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ කාල සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාල සටහනේ ඇතුළත් කිරීම,

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාල සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම,

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර විටී අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීම හෝ නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කිරීම,

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීරණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකි තාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙලක්ද ඇතුළත්ව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාවලියෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම,

(ඔ) වයඹ පළාත් පරිසර අධිකාරිය සමග අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සියලු කටයුතු නියාමනය කිරීම.

(ඕ) 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම හෝ විධිමත් විකල්ප ක්‍රමවේදයක් පවත්වාගෙන යාම,

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුටම පිරිසිදුකාරක ද්‍රව්‍ය, සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම හා එකී සේවකයින් සඳහා සුදුසු රක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හා වසරකට දෙවරකට නොවැඩි සෞඛ්‍ය සායනයන් පැවැත්වීම,

(ග) නිකවැරටිය ප්‍රාදේශීය සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,

(ජ) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට හා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් ලිත් වර්ෂයක් ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම හා එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම,

(ට) (අ) සිට (ජ) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

*අවසර පත්‍රය*

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුම් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම,

(ආ) 1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය යටතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම,

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන තිබීම,

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදුනොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන තිබීම,

(ඉ) අදාළ ව්‍යාපාරය නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් සභාවට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නාවූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නාවූ අපද්‍රව්‍ය නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි නිකවැරටිය ප්‍රාදේශීය සභාවට භාරදීමට එකඟ වීම.

(ii) නිකවැරටිය ප්‍රාදේශීය සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු අවසර පත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ලේකම්වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 23 (i) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවකදී මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) 23 (iv) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

*අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ*

24. නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යයන් සඳහා වෙන් කරන ලද ප්‍රදේශවලට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් කිරීම නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ වයඹ පළාත් පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් නිකවැරටිය ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

26. අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කවර ස්ථානයන් වුවද එකී ස්ථානයට නැතහොත් ඉඩමට මායිම් වන සීමාව තාප්පයක් හෝ ඒ සඳහා සුදුසු ආවරණයක් මගින් සීමා කර තිබිය යුතු අතර එකී ස්ථානයට හෝ ඉඩමට බැහැරලන කැලිකසල සුළඟ, ජලය වැනි කාරණා හේතු කොටගෙන යාබද ඉඩම් හෝ ප්‍රදේශ වෙත යොමු වීමට නොහැකි වන ආකාරයට පවත්වාගෙන යා යුතු ය.

*වෙනත්*

27. (i) සභාපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හීදී යම් පරිශ්‍රයකට ඇතුළත් වීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියාකරන්නේදැයි පරීක්ෂාකර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමණාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් සභාපතිවරයාට හෝ ඔහුගේ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සභාපතිවරයාගේ ඔහුගේ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

*දණ්ඩන*

28. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදකරු වන අතර එම වරද සම්බන්ධයෙන් බලයලත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන නිකවැරටිය ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දණ්ඩන සීමාවන් යටතේ දඬුවම් ලැබිය යුතු යි.

*අර්ථ නිරූපණය*

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ;

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන් ඒවා ඉවත දමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේ එකතුවන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදයක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"එක් රැස් කිරීම" යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ නිකවැරටිය් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකළ හැකි හියුමස් ද්‍රව්‍යයකි.

සභාපතිවරයා :- නිකවැරටිය ප්‍රාදේශීය සභාව සඳහා තේරීපත්වී ඇති සභාපතිවරයා

"ලේකම්" යන්නෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට නිකවැරටිය ප්‍රාදේශීය සභා පනත යටතේ එම

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා අදහස් කෙරෙන අතර එම නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත්කරන ලද යම් තැනැත්තෙකු සහ නිකවැරටිය ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ගබඩා කිරීම" යන්නෙන් හිමිකරුවකුගේ හෝ පදිංචිකරුවකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"ගාස්තුව" යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් ඉවත් කෙරෙන ශාඛා කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ.

"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දෙළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජනය නිෂ්පාදනයන් කිරීමට යොදගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගීකර ගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස්, සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියාකරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොද ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් ආවරණයක් සහිත වූ බක්කියක්, බඳුනක් හෝ උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''බලයලත් එක්රැස් කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට අවස්ථාචෝචිතව ලේකම්වරයා හෝ සභාපතිවරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිත නොකරන ලද්දවුත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දවුත්, සැකසුම් නොකරන ලද්දවුත්, පිරියම් නොකරන ලද්දවුත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරවම රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර, ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරුකිරීම එහි දී සිදු කෙරේ.

''තැනැත්තා'' යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඬුල්ලක් හෝ යම් පුද්ගලයෙක් ද අදහස් කෙරේ.

''නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙක් අදහස් කෙරේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොද ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනයට නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් 1987 අංක 15 දරන නිකවැරටිය ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද නිකවැරටිය ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවීම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සාමාජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝනි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්ත ශාලාව, වත්ත කළමණාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර, වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු ඇතුළත් වේ.

''මෙම වගන්තියේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩා දැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු'' යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

''ඉදිකිරීම් අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නාවූ පස්, මඩ, දූවිලි, හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නාවූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

''ආරෝග්‍ය ශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙලෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදගනු ලබන හෝ යොදගැනීමට අපේක්ෂා කරන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර, සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රවකාරී ආරක්ෂණ ද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කරන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑ මස්, ආසාදනය වන සුළු හා අතිශයෙන් ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලය සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වන අධිකාරය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාර පාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථාන ද මීට ඇතුළත් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

04-831

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.